## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා  ජාතික මෙන්ම ජාත්‍යනත් ර වශයෙන් විවිධ නිර්ණායක භාවිත කරයි. එම නිර්ණායක පදනම් වී ඇත්තේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක මත ය.

**ප්‍රමාණාත්මක සාධක** වශයෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක ව ගණනය කළ හැකි සාධක ය.

නිදසුන්  : යෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය, යොදා ගන්න සේවක  සංඛ්‍යාව, භාවිතයට ගන්නා බල ශක්තිය, වාර්ෂික පිරිවැටුම

**ගුණාත්මක සාධක** යන්නෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක වශයෙන් මැනිය නොහැකි සාධක ය.

නිදසුන් : ව්‍යාපාර සංවිධාන ක්‍රමය, භාවිත කරන තාක්ෂණය, වෙළෙඳපොළ ස්වභාවය

ඉහත නිර්ණායක පදනම් කර ගෙන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සුළු හා ඔදය පරිමාණ ව්‍යාපාර සඳහා විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.
නිදසුන් :

**ස්වාධීන ව අයිති හා ස්වාධීන ව ක්‍රියාත්මක වන එසේ ම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ.**

ඇමරිකා එක්සත් ජනපදයේ ස්මෝල් බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන් ආයතනය
(Small Business Administration Institute - USA )

කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ද විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිත කරයි.

නිදසුන් :

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ**

- වෙළෙඳපොළ කුඩා වීම
- ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම
- සේවක සංඛ්‍යාව අඩු වීම
- පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත කිරීම
- තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදු වීම

- ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම හා බොහෝ විට අයිතිකරුන් ප්‍රධාන කළමනාකරු වීම
- වෙළෙඳපොළ බොහෝ විට දේශීය වීම (නමුත් සමහර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විදේශීය වෙළෙඳපොළට ද නිෂ්පාදිත සපයයි.)
- විශාල ව්‍යාපාරවලට සාපේක්ෂව මේවායේ මූල්‍ය බැඳීම් අඩු වීම
- නවීන තාක්ෂණය භාවිතය අඩු වීම

<u>**රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ ආකාරයෙන් දායකත්වය ලබා දෙයි.**</u>

නිදසුන් :

- මෙම ව්‍යාපාර ශ්‍රම සුක්ෂම කර්මාන්ත නිසා වැඩි රැකියා ප්‍රමාණයක් සැපයිය හැකි වීම
- ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම
- දේශීය සම්පත් භාවිත කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය නිසා නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම
- ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම
- මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය ලබා දීම
- මහා පරිමාණ ව්‍යාපාර ඉටු නොකරන ව්‍යාපාර කටයුතුවල නිරත වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී පහත කරුණු පිළිබඳ ව සැලකිළිමත් විය යුතු ය.

නිදසුන් :

- තම හැකියා හා කුසලතා පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා ඇගැයීම
- නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ හා එම වෙළෙඳපොළට ළගාවිය හැකි ද යන්න
- ............................................................................
- ............................................................................
- ............................................................................
- ...............................................................................

<u>**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට හේතු**</u>

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට බලපා ඇති හේතු**

- ............................................................................
- ............................................................................
- ............................................................................
- විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබා දීම
- දක්ෂ කළමනාකරණයක් තිබීම
- ව්‍යාපාරිකයින්ගේ උනන්දුව හා කැපවීම

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු**

- මූල්‍ය ගැටලු
- වෙළෙඳපොළ තරගකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම
- කළමනාකරණයේ දුර්වලතා
- ව්‍යවසායකත්ව හැකියා අඩු වීම
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
- නව තාක්ෂණික දැනුම අඩුකම හා නව තාක්ෂණය යොදා නොගැනීම

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන අතර ඊට හේතු**

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.

**<u>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර</u>**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

- මූල්‍යමය දිරිගැන්වීම්
- මුල්‍යමය නොවන දිරිගැන්වීම්

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැනවී මට රජය ගෙන ඇති මූල්‍යමය දිරි ගැන්වීම

- කෙටි හා දිගුකාලීන ණය
- මූල්‍යමය ආධාර
- බදු සහන
- ප්‍රතිමූල්‍ය පහසුකම්

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නොවන දිරි ගැන්වීම්

- උපදේශන සේවා
- ව්‍යවසායක සංවර්ධන වැඩ සටහන්
- පර්යේෂණ හා තාක්ෂණික සේවා
- යටිතල පහසුකම් සැපයීම
- වෙළෙඳපොළ පහසුකම් ලබා දීම/අලෙවි පහසුකම්
- විශිෂ්ටතා හා සම්මාන ලබා දීම

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන කොටස් දෙකකට බෙදේ.

- රාජ්‍ය ආයතන
- වෙනත් ආයතන
- 

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන රාජ්‍ය ආයතන

- කාර්මික සංවර්ධන මණ්ඩලය
- අපනයන සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ජාතික සංවර්ධන බැංකුව
- කාර්මික තාක්ෂණ ආයතනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන වෙනත් ආයතන හා සංවිධාන

- සර්වෝදය
- ජයිකා (ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය )
- බදු වාර්තා සකස් කර දෙන පෞද්ගලික ආයතන
- සණස (සකසුරුවම් හා ණය දෙන සමිති )

- පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතන

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් කිහිපයක්

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**<u>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබා දෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති</u>**

කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (ලිය ඉසුර) කාරක ප්‍රාග්ධන සහාය සැපයීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා සුරැකුම් අවශ්‍ය නොවන කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

(2014 මහ බැංකු වාර්තාව)

**සුවන**

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රාහකත්වයෙන්, ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් සුළු කර්මාන්ත ව්‍යවසායකයින් නංවාලමී සඳහා කග්‍රි ාතම් ක වන යොජ් නා කම් යකි. මෙය SMILE (Small & Micro Industries Leader & Entrepreneur promotion project ) ලෙස ද හඳුන්වයි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මෙහි III වන අදියර ය.

**සහන්‍යා**

සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයකි. මේ සඳහා DFCC බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධ වී ඇත.

**සණස ණය ව්‍යාපෘතිය**

කෘෂි, සත්ව, කුඩා කර්මාන්ත, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදවා ගන්නා අතර සණස මහා සංවර්ධන සංගමය පරිපාලන කටයුතු සිදු කරයි.

.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

**සමෘද්ධි/දිවිනැගුම සංවර්ධන ණය යෝජනා ක්‍රමය**

සමෘද්ධිය/දිවිනැගුම බැංකු සංගම් හරහා සමෘද්ධිලාභීන් වෙත ණය දීම හා අනෙකුත් සේවා සැපයීම සිදු කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ සඳහා අවශ්‍ය මුදල් රජයේ ප්‍රධානයන්ගෙන් හා සාමාජිකයින්ගේ තැන්පතු මගින් රැස් කළ ඉතුරුම් මුදල් තුළින් ලබා ගනියි. මෙහි පාලනය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. (සමෘද්ධි/දිවිනැගුම බැංකු ප්‍රාදේශීය සංවර්ධන බැංකු සමග ඒකාබද්ධ කරනු ලබන බව රජය නිවේදනය කර ඇත )

(2014 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව )

**ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය**

(කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යංශය යටතේ ඇති ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි. වගා කටයුතු සඳහා ගොවීන්ටත් කෙටි කාලීන ණය හා දිගුකාලීන ණය ලබා දෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ.